**ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ සහජීවන සංගමයේ ව්‍යවස්ථාව**

1. සහජීවන සංගමයේ නම:..................................................................

2. ලිපිනය:..........................................

3. දුරකථන අංකය ......................................  විද්‍යුත් තැපැල ..................................................

4. දිස්ත්‍රික්කය:.........................  ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:.......................................

   ග්‍රාම නිලධාරී වසම:...........................................................

5. **දැක්ම**: ජාතිය ආගම කුලය වැනි නූතන ලෝකයට අනුචිත ප්‍රතිමාන හේතුවෙන් සිතේ දුකක් ඇති නොවන, දේශපාලන අරමුණු ඉටු කර ගැනීමට අවි නොගන්නා, බහුවිධත්වය පිළිගන්නා සහ ගරු කරනා දේශපාලන බලය සමසේ භුක්ති විඳිමින් ආන්තීකරණය නිසා කඳුළක් නොසලන, සැමට එකසේ සළකන, සැවොම එකසේ සැළකිලි ලබන, සැවොම සතුටින් සහ සහජීවනයෙන් ජීවත්වන ශ්‍රී ලාංකේය අනන්‍යතාවයෙන් යුත් ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩනැංවීම

6. **මෙහෙවර**: සමාජයේ ඇති ජාති, ආගම්, භාෂා අනන්‍යතාව පිළිගනිමින් සහජීවනයෙන් ජීවත් වීම සහ අන්‍යයන් අතර මෙම සහජීවන සංකල්පය ප්‍රවර්ධනය කිරීම

7. **අරමුණු සහ කාර්යභාරය**

   1. ජාතික සහජීවනය හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට ගම් මට්ටමින් ඇති විවධ රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, ස්වේච්ඡා සංවිධාන,සිවිල් සංවිධාන සමඟ ඒකාබද්ධ වී අදාළ වැඩසටහන් ව්‍යාපෘති හඳුනාගෙන අමාත්‍යාංශය වෙත යොමු කර අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කිරීම.
   2. සංස්කෘතික, කලාව, ආගමික උත්සව හා ක්‍රීඩා තරඟ ආදිය තුළින් ජාතීන් අතර සමගිය හා සහජීවනය ඇති කිරීමට කටයුතු කිරීම.
   3. සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාව ඉගැන්වීම සඳහා ප්‍රදේශයේ ජනතාව තුළ ප්‍රවර්ධනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
   4. ජන කොටස් අතර සහජීවනයට බාධා වන ආකාරයේ නොසන්සුන් තත්වයක් ඇති වූ අවස්ථාවක දී සමථකරුවකු ලෙස කටයුතු කිරීම සහ ඒ පිළිබඳ අදාළ රාජ්‍ය සහ සිවිල් පාර්ශවයන්ට දැනුම් දීම.
   5. සමාජය තුළ නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ ආයුධ සංස්කෘතිය පිටු දැකීම හා සමාජය තුළ එය ප්‍රවර්ධනය වීම වැළැක්වීම.
   6. ජාතික සහජීවනය, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රාදේශීය මට්ටමින් ප්‍රචාරය කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ඇතුළුව ප්‍රචාරාත්මක ව්‍යාපාර දියත් කිරීම සහ සංවාදාත්මක වැඩසටහන් පැවැත්වීම.
   7. පොදු උත්සව හා ආගමික කටයුතුවල දී භේදයකින් තොරව සහභාගී වීම හා දායකත්වය ලබා දීම.
   8. අදාළ කොට්ඨාසයේ කුඩා ව්‍යවසායකයන්ට ජීවනෝපාය මාර්ග ප්‍රවර්ධනය කිරීම.
   9. ආන්තීකරණයට ලක් වී ඇති ජන කොටස් හෝ පුද්ගලයින් වේ නම් එම පිරිස සමාජානුයෝජනය කිරීම හා අවැසි ශුභ සාධන පහසුකම් සැපයීම.

10. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය, පසු විපරම් කිරීම සහ ඒ පිළිබඳ අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම.
11. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වන අවස්ථාවල දී අමාත්‍යාංශය නියෝගය අනුව එය නිවැරදි කිරීම සඳහා මැදිහත් වීම හා අදාළ ආයතන දැනුවත් කිරීම.

## 8. වගකීම් දරන කාරක සභාව

- **සභාපති**
- **උප සභාපති**
- **ලේකම්**
- **උප ලේකම්**
- **භාණ්ඩාගාරික**
- **උප භාණ්ඩාගාරික**
- **කාරක සභා සාමාජිකයන් 4 දෙනෙකු**
- **පහසුකාරක- ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර/ සම්බන්ධීකාරක,සහායක**

## 9. සාමාජිකත්වය

සංගමයේ අවම සාමාජිකයින් සංඛ්‍යාව 10 කි. ඉහත පරමාර්ථ ඉටු කරලීම වෙනුවෙන් ස්ව කැමැත්තෙන් සාමාජිකත්වය ලබා ගත යුතුය.සාමාජිකත්වය විවෘත වේ. ක්‍රියාකාරී වැඩසටහන්වලට දායකත්වය අනිවාර්යයයෙන්ම ලබා දිය යුතුය.ඉහත පරමාර්ථයන් උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කරන සාමාජිකයන්ගේ සාමාජිකත්වය කාරක සභාවේ තීරණ මත අවලංගු කළ හැක. ඒ බව ආසන්න මහා සභාවට වාර්තා කළ යුතු අතර සමාජිකත්වය අහිමි වූ අයටද මහ සභාවට කරුණු කියාසිටීමට හිමිකම පවතී. මහා සභාවේ තීරණය අවසාන තීරණය වේ.

## 10. මහා සභාව

පළමු වර රැස්වී වගකීම දරණ කාරක සභාවක් පත් කර ගැනීමෙන් අනතුරුව සාමාජිකයන්ට වඩා පහසුවන වේලාවක පහසු ස්ථානයක දී මසකට වරක් හමුවිය හැකිය. එහිදී පැමිණීමේ ලේඛනයක් හා වාර්තා තබා ගැනීමක් ලේකම් විසින් කළ යුතු වේ. මහා සභාව විසින් පත් කළ වගකීම් දරණ කාරක සභාවේ කාල සීමාව වර්ෂයකි. ඉන්පසුව නව කාරක සභාවක් පත් කර ගත හැකිය. සභාවේ සනපූරණය 2/3 වේ. සහජීවන සංගමය අමාත්‍යාංශය යටතේ සෘජුව ක්‍රියාත්මක වන සංගමයක් ලෙස පවත්වා ගැනීමට වගබලා ගැනීම මහ සභාව විසින් සිදු කළ යුතු වේ.

## 11. අනු කමිටු

අංක 07 හි සඳහන් කාර්යභාරය මුදුන්පත් කර ගැනීම සඳහා වගකීම් දරන්නන් තිදෙනෙකු බැගින් වෙන් වී කණ්ඩායම් 03 කට ගොනු විය යුතුය. අදාළ කාර්යභාරය ඉටු කර ගැනීම සඳහා වූ වැඩසටහන්, ව්‍යාපෘති එකී කමිටු විසින් යෝජනා කර වගකීම් දරණ කාරක සභාවට ඉදිරිපත් කර ක්‍රියාත්මක කළ යුතුය.

12. අරමුදල් ගොඩනැංවීම

ප්‍රාදේශීය ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයේ මූල්‍ය සහයක් අවශ්‍ය වන්නේ නම් ව්‍යාපෘති වාර්තාව සහ ඇස්තමේන්තුව ඉදිරිපත් කළ යුතු අතර ප්‍රමුඛතාවය සහ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන සැළකිල්ලට ගෙන මූල්‍ය සහය ලබා ගත හැකිය.

මහා සභාවේ එකඟතාවය මත අරමුදල් ගොඩනැංවිය හැකිය. රාජ්‍ය නොවන සංවිධානවල සහය ලබා ගැනීමේදී අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතුය. ගිණුම් වාර්තා තබා ගැනීම භාණ්ඩාගාරික විසින් සිදු කළ යුතු අතර කාරක සභාවට ද ගිණුම් වාර්තා ඉදිරිපත් කළ යුතුය. මූල්‍ය වර්ෂය අවසානයේ දී සභාව විසින් අනුමත කරන ලද ගිණුම් වාර්තා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

යම් සංගමයක මූල්‍ය අක්‍රමිකතාවයක් සිදු වී ඇතැයි සනාථ වූ අවස්ථාවකදී සංගමයේ ලියාපදිංචිය අවලංගු කිරීම අමාත්‍යාංශය සතු වේ.

13. නියාමනය

**ජාතික සහජීවනය,සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර /සම්බන්ධීකාරක /සහායක නිලධාරීන් විසින් අමාත්‍යාංශය තීරණය කරන කාල වකවානු තුළ තම දිස්ත්‍රික්කයට / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සහජීවන සංගම් සහ එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තා අමාත්‍යාංශය වෙත යොමු කිරීම සිදු කළ යුතු වේ.**

14. ලියාපදිංචිය

සියලුම සහජීවන සංගම් අමාත්‍යාංශයේ ලියාපදිංචි කළ යුතුය. අදාළ අයදුම්පත් දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු අමාත්‍යාංශයේ ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර /සම්බන්ධීකාරක, සහායක හරහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති අවස්ථාවක ග්‍රාම නිලධාරීගේ නිර්දේශය මත ලියාපදිංචිය සඳහා අයදුම්පත ඉදිරිපත් කළ හැකිය.

**15.** විසුරුවා හැරීම

පරමාර්ථ ඉටුවීම හෝ සමිතිය පවත්වා ගෙන යා නොහැකි අවස්ථාවක් මතු වූ විටක හෝ සමිතිය විසුරුවා හැරීම මහ සභාවේ තීරණය මත සිදුවිය හැකි අතර, එසේ සහජීවන සංගමය විසුරුවා හැරියහොත් ඒ පිළිබඳ සහජීවන සංගමයේ ලේකම් විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දීම සිදුකළ යුතුය.

.............................. ..............................

ලේකම් සභාපති

දිනය .......................